69

<u>බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල</u>
<u>ගිනි නිවීම් සේවා ඒකකයන්හි</u>
<u>ස්ථානභාර නිලධාරි තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය</u>

**01.** **සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : පළාත් පාලන දෙපාර්තමේන්තුව(බ.ප)
යොමු අංකය : LGD/2/21/03/06-1 වෙළුම
දිනය : 2018.05.29

1.2 අමාත්‍යාංශය : පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප)
යොමු අංකය : CM/WP/E15/5/1-29
දිනය : 2016.06.18

1.3 කළමනාකරණසේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම :
යොමු අංක හා දිනය : DMS/WP/0601 හා 2016.04.22 සහ
DMS/D/0217 හා 2016.05.12

1.4 ප්‍රධාන ලේකම් (බ.ප.) නිර්දේශය :
යොමු අංකය : CSO/PTR/15/3/28(A)
දිනය :

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය :
දිනය :

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/4/7/343
දිනය : 2018/09/27

1.6 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය :
දිනය :

1.7 බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය
යොමු අංකය :
දිනය :

**02.** **පත්කිරීම් බලධරයා** : මහා නගර සභාවක් වන විට නාගරික කොමසාරිස් / නගර සභාවක් වනවිට ලේකම්.

ක්‍රියාත්මක වන දිනය : බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මකවේ.

**03.** **සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : නියාමන සේවා
3.2 ශ්‍රේණි : අදාළ නොවේ
3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

බස්නාහිර පළාත් සභාව විසින් පනවනු ලබන ගිනි නිවීම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථා සහ ඒ හා සම්බන්ධ නීති රීතිවලට අනුකූලව ගිනි සහ වෙනත් ආපදා අවස්ථාවලදී ජීවිත හා දේපළ බේරා ගැනීම සඳහා පවරනු ලබන කාර්යයන් සහ ඒ හා සම්බන්ධ සියලුම සේවාවන් ඉටුකරගැනීමේ දී තනතුරට අදාළව පවරනු ලබන කළමනාකරණ, අධීක්ෂණ හා මෙහෙයුම් කාර්යයන් ඇතුළත් සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම :
තනතුරට නියම කරන ලද කාර්යයන් දෙපාර්තමේන්තු ප්‍රධාන / ආයතන ප්‍රධාන විසින් පවරනු ලැබිය හැකිය.

**04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර ,විශ්‍රාම වැටුප් සහිත**

**05. වැටුප්**

5.1 වැටුප් කේත අංකය : RS 4 - 2016 (රා.ප.ච.03/2016 අනුව)

5.2 වැටුප් පරිමාණය : රු. 37,030 - 660 x 24 - 52,870/=

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| තනතුර | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| ස්ථානභාර නිලධාරි | 01 පියවර | රු. 37,030/= |

සටහන :
බඳවා ගැනීම්වල දී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණ සඳහන් කිරීමේදී අංක 03/2016 චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන් කළ යුතුය.එහෙත් ගෙවීම් කළ යුත්තේ , උපලේඛන II හි සඳහන් පරිදි බැව් පත්වීම් ලිපියේ සඳහන් කළ යුතුය.

**06. සේවා ගණයට අයත් තනතුර /තනතුරු**

6.1 අනුමත තනතුරු නාම ,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ස්ථානභාර නිලධාරි | අදාළ නොවේ | 28 | i. රාජකාරි කණ්ඩායම් මෙහෙයවීම, නායකත්වය දැරීම සහ ගිනිහට, යාන්ත්‍රික ගිනිහට, පළමුපෙළ ගිනිහට සහ මූලික ගිනිහට තනතුරුවල කාර්යයන් අධීක්ෂණය, අණ දීම.<br>ii. ගිනි මෙහෙයුම් හා වෙනත් ආපදා කටයුතු, ගිනි නිවාරණ කටයුතු, පුහුණු කටයුතු හා අභ්‍යන්තර විනය පවත්වාගෙන යාම<br>iii. ප්‍රාදේශීය නිලධාරි රාජකාරි කටයුතු සඳහා සහාය දීම.<br>iv. ගිනි නිවීම් සේවා ස්ථානයේ රාජකාරී කටයුතුවලදී සහභාගිවන මානව සම්පත් හා අදාළ සියලුම කාර්යයන් අධීක්ෂණය හා කළමනාකරණය.<br>v. අංශ ප්‍රධාන /ආයතන ප්‍රධාන හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන ඕනෑම රාජකාරියක් ඉටුකිරීම |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GCS/ADM/H/7/3/13
දිනය : 2018/09/27

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : ස්ථානභාර නිලධාරි - 28

| ආයතනය | ස්ථානභාර නිලධාරි |
|---|---|
| කොළඹ මහා නගර සභාව | 21 |
| දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව | 01 |
| මොරටුව මහ නගර සභාව | 01 |
| මීගමුව මහ නගර සභාව | 01 |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව | 01 |
| ගම්පහ මහ නගර සභාව | 01 |
| හොරණ නගර සභාව | 01 |
| කළුතර නගර සභාව | 01 |
| එකතුව | 28 |

**07. බඳවාගැනීමේ ක්‍රමය**

7.1 බඳවාගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නොවේ |

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : WPPSC/ADM/7/7/343
දිනය : 2018/09/27

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : ස්ථානභාර නිලධාරි තනතුර ශ්‍රේණිගත තනතුරක් නොවන බැවින් අදාළ නොවේ

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.3 පළපුරුද්ද :

අංශභාර නිලධාරි/මූලික ගිනිහට තනතුරේ ස්ථිර කර තිබීම හා එම තනතුරේ අවම වශයෙන් වසර තුන (03)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

හෝ

ගිනි ඉංජිනේරු ප්‍රාථමික විභාගය සමත් පළමුපෙළ ගිනිහට තනතුරේ ස්ථිර කර තිබීම හා එම තනතුරේ අවම වශයෙන් වසර පහ (05)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

හෝ

ගිනි ඉංජිනේරු ප්‍රාථමික විභාගය සමත් යාන්ත්‍රික ගිනිහට තනතුරේ ස්ථිර කර තිබීම හා එම තනතුරේ අවම වශයෙන් වසර හත (07)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

7.3.2.4 කායික සුදුසුකම් :

තනතුරට අදාළ රාජකාරි කටයුතු ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :

i. අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වාසන්නතම වසර තුන (03) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව පත් කිරීමේ දිනට පෙරාතුව වසර පහ (05)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස

7.3.3.1 අවම සීමාව : ගිනි නිවීම් සේවාවේ නියුතුවූවන්ගෙන් බඳවා

7.3.3.2 උපරිම සීමාව : ගන්නා බැවින් වයස් සීමාව අදාළ නොවේ.

ගුරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS | ADM | 4 | 7 | 343
දිනය : [illegible] | 09 | 27

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

බඳවා ගැනීම සඳහා ලිඛිත පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා භාජනය කරනු ලැබේ.

ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

සංලක්ෂ්‍යය :

පළමු වතාවට පමණක් මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මකවන දිනට අංශභාර නිලධාරි තනතුරේ සේවයේ නියුතු නිලධාරීන්ට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මුහුණ දීමට අවස්ථාව ලබා දෙන අතර සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

තවදුරටත් පුරප්පාඩු පවතී නම්, 7.3.5 අනුව අයදුම්පත් කැඳවීමෙන් බඳවා ගැනීමට කටයුතු කරනු ඇත.

7.3.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | අවම සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව | 100 | 40 |
| ගිනි නිවීම් සේවා මෙහෙයුම් | 100 | 40 |
| ගිනි ප්‍රවේශම | 100 | 40 |
| මානව සම්පත් කළමනාකරණය | 100 | 40 |

විභාග විෂය නිර්දේශය උපලේඛන අංක 01 හි දැක්වේ

7.3.4.1.1 : පවත්වන බලධරයා :

පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණු :

මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ.ලකුණු ලබා දෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලැබේ.

7.3.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ගිනි තාක්ෂණ අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ |
| අමතර සේවා කාලය | 30 | |
| රාජකාරියේ දී දක්වන විශේෂ කුසලතා | 30 | |
| කාර්යසාධන ඇගයීම් | 25 | |
| පෞරුෂය | 05 | |
| එකතුව | 100 | |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ විෂය නිර්දේශය උපලේඛන අංක 02 හි දැක්වේ

7.3.4.2.1 පවත්වන බලධරයා :

පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ ... /3/3
දිනය : 2016/09/27

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :
අභ්‍යන්තර දැන්වීමක් මගින් අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ නියුතු සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ

## 08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| ස්ථානභාර නිලධාරි කාර්යක්ෂමතා කඩඉම | ස්ථානභාර නිලධාරි තනතුරට පත් වී වසර තුනක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උපලේඛන අංක 03 ) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද?
වසරකට වරක් හෝ අවශ්‍යතාව පරිදි

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද?

පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

**09.** **භාෂා ප්‍රවීණතාවය**

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාව | අදාළ නොවේ . |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුශාංගික චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| සන්ධාන භාෂාව | අදාළ නොවේ |

**10.** **තනතුරට උසස් කිරීම** : අදාළ නොවේ.

**11.** **තනතුරුවලට පත්කිරීම** : අදාළ නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

**12.** **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට හා නියෝගවලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

**13.** **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

**14.** **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය**

මෙම පරිපාටිය ක්‍රියාත්මකවන දිනට **ස්ථානභාර නිලධාරි (මෙහෙයුම්, ගිනි නිවාරණ, පුහුණු) තනතුර දරන නිලධාරීන්** මෙම පරිපාටිය යටතේ **ස්ථානභාර නිලධාරි තනතුරට** අන්තර්ග්‍රහණය කෙරේ.

- අන්තර්ග්‍රහණය කිරීමට පෙර සිටි තනතුරට අදාළව පත්වීම ස්ථිර කර තිබීම, කාර්යක්ෂමතා කඩඉම සමත්වී තිබීම සහ උසස් කිරීමේ පාඨමාලා සම්පූර්ණ කර තිබීම, අන්තර්ග්‍රහණය කරන ලද තනතුර සඳහා එම අවශ්‍යතාවලින් නිදහස් කිරීමට හේතුවේ.

- මෙම පරිපාටිය යටතේ අන්තර්ග්‍රහණය කරන ලද සියලුම නිලධාරීන් හට හිමිව තිබූ ජ්‍යෙෂ්ඨත්වය එම නිලධාරීන් හට පෞද්ගලිකවම බලපැවැත්වෙන සේ තවදුරටත් නොවෙනස්ව පවතී.

- අන්තර්ග්‍රහණය කරන ලද සියලුම නිලධාරීන් RS 4 – 2016 වැටුප් පරිමාණයේ තනතුරට අදාළ වැටුප් තලයේ පිහිටුවිය යුතුය.

- ආයතන සංග්‍රහයේ vii වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය යටතේ වැටුප් පරිවර්තනය කළ යුතු අතර ලබමින් සිටින වැටුප සහ නව වැටුප් පරිමාණයේ වැටුප් පියවර සමාන වන අවස්ථාවලදී අතිරේක වැටුප් පියවරක් දෙනු නොලැබේ. වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

අන්තර්ග්‍රහණය කරන ලද සියලුම නිලධාරීන්හට මෙම කොන්දේසි යටතේ අන්තර්ග්‍රහණය කරන ලද බවට ලිපියක් නිකුත් කරනු ලැබේ.

**15.** **මෙම පරිපාටියේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධව ගැටළු පැන නගින අවස්ථාවක දී හා/හෝ මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.**

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/4/7/3243
දිනය : 2018/09/27

**16.** **අර්ථ නිරූපණ**

<u>සතුටුදායක සේවා කාලය</u>

පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත් වීම මගින් ද සිදු කළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය .

නිලධරයා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නිත්‍යානුකූල හේතු මත අත්හිටුවා , අඩු කොට, නතර කොට හෝ විලම්බනය කොට ඇති කාලපරිච්ඡේදයක් වේ නම් එය ද ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ ,වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක්ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය .

<u>සක්‍රිය සේවා කාලය :</u>

"සක්‍රිය සේවා කාලය" යනු ,ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

නියමිත දිනට :

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු දිනය, " නියමිත දිනය " ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස් වීම් වලදී නියමිත දිනට හෝ පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් වන නිලධාරින්ට බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි උසස් වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරින්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

උදා :
වසර තුනක දී සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම වසර හතරකින් සමත් වුවහොත් වසර දහයකින් ලැබිය යුතු උසස් වීම ලැබෙනුයේ වසර එකොළහකිනි.

සකස් කළේ: අත්සන ............................ 18.05.22
නම ඒ. කේ. ජී. එම්. මෛත්‍රීරත්න
තනතුර පරිපාලන නිලධාරි පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.) කොළඹ 07.
නිලමුද්‍රාව ............................

පරීක්ෂා කළේ : අත්සන ............................ 18-5-23
නම : ............................
තනතුර : ............................
නිලමුද්‍රාව : ............................

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/4/7/323
දිනය : 2018/06/27

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය 18.05.29

අත්සන : ............................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
නම : ............................
තනතුර : ............................
නිලමුද්‍රාව චන්ද්‍රානි සමරකෝන් පළාත් පාලන කොමසාරිස් බස්නාහිර පළාත.

යොමු අංකය : CM/WP/E15/5/1-29

බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ස්ථානභාර නිලධාරි තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය : 6/18

අත්සන : ............................
නම : ............................
ලේකම්
පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප)
නිලමුද්‍රාව චන්ද්‍රානි සමරකෝන් ලේකම් (වැ.බ.), පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලප්‍රවාහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය (බස්නාහිර පළාත)

යොමු අංකය : CSWP/PTR/15-3/FI/28(A)

බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ස්ථානභාර නිලධාරි තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය : 2018/6/27

අත්සන : ...........................................
නම : ...........................................
ප්‍රධාන ලේකම් (බ.ප)
නිලමුද්‍රාව

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

යොමු අංකය : WPC/PSC/ADM/16/4/33

බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ස්ථානභාර නිලධාරි තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

දිනය : 2018.09.07

අත්සන : ...........................................
නම : ...........................................
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)
නිලමුද්‍රාව

එම්. ජී. ඒ. තිලකරත්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/4/7/343
දිනය : 2018/09/27

යොමු අංකය: GOS/ADM/4/7/341

බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ස්ථානභාර නිලධාරි තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය 2018/9/20 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

දිනය : 2018/9/27

අත්සන : ...........................................
නම : ...........................................
ආණ්ඩුකාර ලේකම් (බ.ප)
නිලමුද්‍රාව

පී. සෝමසිරි
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලය,
10 වන මහල, ජනජය ගොඩනැගිල්ල,
අංක.628, තලවල පාර, රාජගිරිය.

උපලේඛන අංක : 01

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ස්ථානභාර නිලධාරි තනතුරට බඳවා ගැනීමේ ලිඛිත විභාගය**

01. විභාගයේ නම :
බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ස්ථානභාර නිලධාරි තනතුරට බඳවා ගැනීමේ ලිඛිත විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුලු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව | පැය 01 | 100 | 40 |
| ගිනි නිවීම් සේවා මෙහෙයුම් | පැය 01 | 100 | 40 |
| ගිනි ප්‍රවේශම | පැය 01 | 100 | 40 |
| මානව සම්පත් කළමනාකරණය | පැය 01 | 100 | 40 |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GS/ADM/H/7/343
දිනය : 2018/05/27

03. පවත්වනු ලබන බලධරයා
පත්කිරීම් බලධරයා විසින් හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු ඇතිවන අවස්ථාවලදී

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව | ගිනි මෙහෙයුම් සඳහා අදාළ විද්‍යාත්මක හා තාක්ෂණික ගණනය කිරීම් |
| ගිනි නිවීම් සේවා මෙහෙයුම් | ගිනි මෙහෙයුම් පාලනය සහ කළමනාකරණය |
| ගිනි ප්‍රවේශ | ගොඩනැගිලි සැලසුම් සහ ස්ථාවර ගිනි නිවන ක්‍රම හා ගිනි නිවාරණය |
| මානව සම්පත් කළමනාකරණය | පුහුණු සහ සංවර්ධනය, අභිප්‍රේරණය, සෞඛ්‍ය ආරක්ෂණය, ගැටුම් හා අර්බුද කළමනාකරණය, මානව සම්පත් ප්‍රතිපත්ති සැලසුම්කරණය, ව්‍යාපෘති කළමනාකරණය, කාර්යසාධන කළමනාකරණය සම්බන්ධයෙන් පුළුල් වශයෙන් සලකා බලනු ලැබේ. |

අත්සන ..................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම ........ චන්ද්‍රානි සමරකෝන්
තනතුර ........ පළාත් පාලන කොමසාරිස්
දිනය ........ බස්නාහිර පළාත
නිල මුද්‍රාව ..................................

18.05.29

**<u>බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ස්ථානභාර නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහාවන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය</u>**

01. පරීක්ෂණයේ නම :

බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ස්ථානභාර නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහාවන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **<u>ගිනි තාක්ෂණ අධ්‍යාපන සුදුසුකම්</u>**<br>ගිනි ඉංජිනේරු ප්‍රාථමික විභාගය (Level 02) විභාගය | 10 | අදාළ නොවේ |
| **<u>අමතර සේවා කාලය</u>**<br>7.2.3.2 හි බඳවා ගැනීමේ දී සලකා බලන සේවා කාලයට අමතර සේවා කාලය<br>අංශභාර නිලධාරි - ලකුණු 06<br>මූලික ගිනිභට - ලකුණු 05<br>පළමුපෙළ ගිනිභට - ලකුණු 04<br>යාන්ත්‍රික ගිනිභට - ලකුණු 03<br>(උපරිම වසර 05 ක් සඳහා සලකා බලනු ලැබේ) | 30 | |
| **<u>රාජකාරියේ දී දක්වන විශේෂ සේවා ඇගයීම</u>**<br>ප්‍රශංසා ලිපි/කුසලතා සහතික/විශේෂ සේවා සඳහා ඇගයීම්<br>(පිළිගත හැකි ආයතනයක් මගින් නිකුත් කරන ලද සහතික හෝ ලිපි මගින් ඉදිරිපත් කළ යුතුය. එක් සහතිකයකට ලකුණු 05 බැගින්) | 30 | |
| **<u>කාර්යසාධන ඇගයීම</u>**<br>(පූර්වාසන්න වසර 05ක කාලය සඳහා)<br>ඉතා හොඳයි - ලකුණු 05<br>හොඳයි - ලකුණු 03<br>සතුටුදායකයි - ලකුණු 01 | 25 | |
| **පෞරුෂය** | 05 | |
| එකතුව | 100 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GS/ADM/4/7/343
දිනය : 2018/09/27

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා :

පත්කිරීම් බලධරයා විසින් හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු ඇතිවන අවස්ථාවල දී

| | |
|---|---|
| සකස් කළේ : අත්සන ......[signature]...... 18.05.22 | පරීක්ෂා කළේ : අත්සන ......[signature]...... 18.5.23 |
| (විෂයභාර නිලධාරියා) | (විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) |
| නම : ඒ. කේ. පී. එම්. මෛත්‍රීරත්න | නම : සෙව්වන්දි හෙට්ටිආරච්චි |
| තනතුර : පරිපාලන නිලධාරී, පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.) | තනතුර : පළාත් පාලන සහකාර කොමසාරිස් |
| දිනය : කොළඹ 07. | දිනය : පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, කොළඹ දිස්ත්‍රික්කය |

අත්සන ......[signature]......

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : චන්ද්‍රානි සමරකෝන්

තනතුර : පළාත් පාලන කොමසාරිස්

දිනය : බස්නාහිර පළාත.

18-05-29

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

ගොනු අංකය : G05/ADM/2/7/3213

දිනය : 2018/04/27

## බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ස්ථානභාර නිලධාරි තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)

01. විභාගයේ නම :

බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ස්ථානභාර නිලධාරි තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුලු ලකුණු | අවම සමත් ලකුණ |
|---|---|---|---|
| ගිනි නිවීම් සේවා මෙහෙයුම් හා නිවාරණය | පැය 02 | 100 | 40 |
| මානව සම්පත් කළමනාකරණය | පැය 01 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා

පත්කිරීම් බලධරයා විසින් හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :
වසරකට වරක් හෝ අවශ්‍ය අවස්ථාවල දී

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS | ADH | 21 | 7 | 343
දිනය : 2018 | 09 | 27

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | | විෂය නිර්දේශය |
|---|---|---|
| ගිනි නිවීම් සේවා මෙහෙයුම් හා නිවාරණය | i. | ගිනි මෙහෙයුම් සඳහා අදාළ සෛද්ධාන්තික කරුණු |
| | ii. | ද්විතිය භාෂා හැකියාව (ඉංග්‍රීසි /දෙමළ) |
| | iii. | විද්‍යා හා තාක්ෂණික කරුණු ගිනි මෙහෙයුම් සහ නිවාරණය සඳහා යොදා ගැනීමේ අවස්ථා |
| | iv. | ප්‍රායෝගික ගිනි මෙහෙයුම්වල ද ස්ථානභාර නිලධාරි රාජකාරි පිළිබඳ දැනීම |
| | v. | ගිනි නිවීම් සේවා ස්ථාන පාලනය |
| | vi. | මානව සම්පත් කළමනාකරණය (ද්විතිය දැනුම) |
| | vii. | ගිනි නිවීම් සේවා ස්ථාන පරිපාලනය |
| | viii. | නායකත්වය (ද්විතිය දැනුම) |
| | ix. | සැලසුම් කිරීම (ද්විතිය දැනුම) |
| | x. | කාර්යසාධන කළමනාකරණය (ද්විතිය දැනුම) |
| | xi. | තොරතුරු රැස්කිරීම, තබා ගැනීම හා ඒ ඇසුරෙන් තීරණ ගැනීමේ හැකියාව |
| | xii. | ආයතනික අවදානම් කළමනාකරණය (ද්විතිය දැනුම) |
| | xiii. | සන්නිවේදනය (Chain of Command Effective Teams Breafing & Presentaion) |

| | | |
|---|---|---|
| | xiv. | ගිනි හා මුදා ගැනීමේ අවස්ථාවල දී තීරණ ගැනීමේ හැකියාව (Decisition Making Procedure in an Emergensy) |
| | xv. | සෞඛ්‍ය හා ප්‍රවේසම |
| | xvi. | සියලුම හදිසි සිදුවීම් පාලනය සඳහා අණදීම (ද්විතීය දැනුම) |
| | xvii. | උස් ගොඩනැගිලිවල ගිනි නිවීම් ක්‍රම - ඉතා උස් හා මධ්‍යස්ථ ගොඩනැගිල් (ද්විතීය දැනුම) |
| | xviii. | අවදානම් තක්සේරුව සහ ඊට අදාළ උපායන් තීරණය කර ක්‍රියාත්මක කිරීම |
| | xix. | අවදානම් තක්සේරුව සහ ඊට අදාළ උපායන් තීරණය කර ක්‍රියාත්මක කිරීම |
| | xx. | විවිධ ස්ථාන ආශ්‍රිත ගිනි නිවීම් ක්‍රම හා මුදාගැනීම |
| | xxi. | ගිනි නිවාරණ ක්‍රම - දැනුවත් කිරීම හා පරීක්ෂා කිරීම (ද්විතීය දැනුම) |
| ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. ගොනු අංකය : GOS/ADM/A/7/343 දිනය : 2018/09/23 | xxii. | ගිනි ආරක්ෂණ කළමනාකරණ ප්‍රමිතීන් හා නියමයන් ක්‍රියාත්මක කිරීම |
| | xxiii. | ගැටුම් කළමනාකරණය සහ උපදේශනය |
| මානව සම්පත් කළමනාකරණය | | ගිනි මෙහෙයුම් නිවාරණය, කණ්ඩායම් හැසිරවීම හා සාමාන්‍ය පරිපාලනය (කණ්ඩායම් අභිප්‍රේරණය, වාර්තා සැකසීම, තීරණ ගැනීම, අවදානම් කළමනාකරණය, නායකත්ව ගුණාංග) ඇසුරෙන් සැකසුන ප්‍රශ්න පත්‍රයකි. |

අත්සන ..........H..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම ..........................
තනතුර ..........චන්ද්‍රානි සමරකෝන්
දිනය ..........පළාත් පාලන කොමසාරිස් බස්නාහිර පළාත.
නිල මුද්‍රාව ..........................

18-05-29